පුස්තකාලය

THE LIBRARY

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව

UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

පුස්තකාලයාධිකාරී/Librarian : 011-2804194
පුස්තකාලය/Library : 011-2758525
ෆැක්ස් /Fax : 011-2804194
ඊ-මේල් /E-Mail : librarian@sjp.ac.lk

නුගේගොඩ, ශ්‍රී ලංකාව
NUGEGODA, SRI LANKA
තැපැල් පෙට්ටිය - 85, නුගේගොඩ
Post Office Box - 85, Nugegoda


2022.12.10

## මාධ්‍ය නිවේදනයයි

**මහජන පුස්තකාල පද්ධතිය තුළ විනෝදයෙන් ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා ඉංග්‍රීසි භාෂෝද්ග්‍රහණ කේන්ද්‍ර පිහිටුවීම සනිටුහන් කිරීමට, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය පුස්තකාල වෙබ් අඩවියේ, "විනෝදයෙන් ඉංග්‍රීසි" වෙබ් පිටුව දියත් කිරීමේ උත්සවය**

සිංදු හා කතාවල හඬ පට සහිතව ශිෂ්‍ය අත්පොතක් හා ගුරු අත්පොතකින් සමන්විත වන ඉංග්‍රීසි භාෂාව පෙර පාසල් දරුවන්ට හුරු කිරීමේ ව්‍යාපෘතියක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා කොළඹ මහජන පුස්තකාලය මගින් ආරම්භ කිරීමට නියමිත ය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් මෙම වැඩ සටහන රට පුරා ඇති මහජන පුස්තකාලවල ඉංග්‍රීසි භාෂෝද්ග්‍රහණ කේන්ද්‍ර පිහිටුවීම මගින්, බොහෝ ප්‍රදේශවලට බෙදාහැරීමට කටයුතු යොදා ඇත. මෙම විෂය මාලාව සිංහල හා දෙමළ භාෂාවට ද පරිවර්තනය කර ඇති හෙයින්, ඉංග්‍රීසි නොදන්නා වැඩිහිටියෙකුට වුවද, තම දරුවන්ට ඉංග්‍රීසි භාෂාවට අවතීරණය වීමට අවස්ථාවක් දිය හැකිය. සියලු දේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ නිල වෙබ් පිටුවෙන් නොමිලේ බාගත කළ හැක. englishforfun@sjp.ac.lk විද්‍යුත් ලිපිනයෙන්, පුස්තකාලයාධිපතිනි ආචාර්ය නයනා විජයසුන්දරට ඉල්ලීමක් කිරීමෙන්, මෙම සම්පූර්ණ විෂය මාලාව ගෙන්වාගෙන නිවසේදීම ළදරුවාට ඉංග්‍රීසි අයත්වන පරිසරයක් නිර්මාණය කිරීමට ද හැකි වනු ඇත.

මෙම ව්‍යාපෘතිය නිර්මාණය කරන ලද්දේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය මධුභාෂිණී දිසානායක රත්නායක විසිනි. ඉංග්‍රීසි භාෂාව කුඩා ළමයකුගේ වැඩෙන වයස පිළිබඳව ඇති ප්‍රසන්න මතකයන් බවට පත්කිරීම සඳහා, එය වැඩීමේ කොටසක් ම කර ද්විභාෂක ළමා කාලයක් උරුම වන්නේ මෙම රටේ සුළුතරයකට පමණි. මෙම තත්වය වෙනස් කිරීමට අවශ්‍ය නම්, එය කිරීමට හැකි වනුයේ ක්‍රම දෙකකින් ය. එකක් නම් අධ්‍යාපන පද්ධතිය මගින්ය; අනික මහජන පුස්තකාල මගින්ය. "විනෝදයෙන් ඉංග්‍රීසි" වැඩසටහන මෙම දෙවිදිහට ම දීමට දැන් කටයුතු යොදා ඇත. උතුරු ප්‍රදේශයේ පෙර පාසල් 30 ක් දැනට ම මෙම විෂය මාලාව ළමයින් සඳහා ක්‍රියාත්මක කරයි. කොළඹ මහජන පුස්තකාලයට සම්බන්ධ පෙර පාසල් 12 ක ද මෙම වැඩසටහන නොබෝ දිනකින් ක්‍රියාත්මක වනු ඇත. ළමා කවි (Nursery Rhymes) 23 කින් හා කතා 8 කින් සමන්විත වන මෙම විෂය මාලාව ඉතා කුඩා පියවරක් වුවද මෙය සාර්ථකව ස්ථාපිත කිරීමට හැකි වුවහොත් ළමයින්ගේ ජීවිතවල ඉංග්‍රීසි ඉගෙනගැනීම සම්බන්ධයෙන් විශාල වෙනසක් කිරීමට හැකි වනු ඇත.

මෙම වැඩසටහන ආරම්භ කිරීම සනිටුහන් කිරීමේ උත්සවය දෙසැම්බර් මස 13 වෙනි දින පෙ.ව. 9 ට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ දී සිදු කෙරේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ, එහි මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති මහාචාර්ය නන්ද ධර්මරත්න, කොළඹ මහජන පුස්තකාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපතිනි වරුණි ගඟබඩආරච්චි ආදීන්ගේ සහභාගිත්වයෙන් මෙය සිදු කෙරේ. රට පුරා පිහිටි මහජන පුස්තකාලයාධිපතිවරුන් ද zoom තාක්ෂණය ඔස්සේ මෙයට සහභාගි වීමට නියමිත ය. දෙමළ බසින් දේශනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අංශයේ හිටපු අංශාධිපතිනි පාර්වතී නාගසුන්දරම් විසින් හා ඉංග්‍රීසි භාෂාවෙන් මුඛ්‍ය දේශනය තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ හිටපු සභාපති මහාචාර්ය රජීව විජේසිංහ විසින් කරනු ලබයි.

ආචාර්ය එන්. විජයසුන්දර
පුස්තකාලයාධිපති

Dr. (Mrs.) Nayana Wijayasundara
Librarian
University of Sri Jayewardenepura
Nugegoda, Sri Lanka.